# හිත හොඳ සිංහ පැටියා



මන්දුලී වික්‍රමආරච්චි

**කෘතියේ නම:** හිත හොඳ සිංහ පැටියා

**කතෘගේ නම:** මන්දුලි වික්‍රමආරච්චි

කතෘ ප්‍රකාශනයකි

**කතෘගේ වෙනත් කෘති:** අකීකරු දුව

**කෘතිය පළ කරන දින:** 2025 පෙබරවාරි 08

**ISBN: 978-624-208-265-3**

# පිදුම

දයාබරත්වයෙන් මා හට ඔවදන් දී

දැනුම රැස් කොට

මා දිරි ගැන්වූ

දයාබර ගුරු  මැණියන්ට

සහ

උපකාර කල සැමට

මෙම පොත පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන .හෙරණගත්කරණී” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

**මන්දුලී වික්‍රමආරච්චි**

**5 ශ්‍රේණිය C**

**මහමායා බාලිකා විද්‍යාලය**

**මහනුවර**

# හිත හොඳ සිංහ පැටියා

එකෝමත් එක කාලෙක පුංචි සිංහ පැටියෙකුයි එයාගේ සිංහ අම්මායි ඉතා සතුටින් ජීවත් වුණා. පුංචි සිංහ පැටියා හරිම දඟයි. එයාගේ නම හිනී. එයාගේ අම්මාගේ නම රුවී. හිනී හරිම ලස්සනයි. ඒ නිසා එයාගේ අම්මා එයාව ආරක්ෂා කරනවා.



සිංහ අම්මා හිනීට හරිම ආදරෙයි. හිනීත් අම්මාට ආදරෙයි. හිනී පාසල් යන වයසට පැමිණි විට එයාගේ අම්මා එයාව පාසල් යැව්වා. හිනී ආසාවෙන් පාසල් ගියා. පාසලේ විභාගයත් ළඟ ළඟම ඇවිල්ලා. හිනී විභාගයට පාඩම් කරනවා. හිනී ගොඩක් දක්ෂයි. විභාගය ආවා. හිනී හොඳට පාඩම් කළ නිසා හිනී විභාගය හොඳට කළා.

විභාග ප්‍රතිඵල ආවා. හිනී තමයි පන්තියේ පළවෙනියා. එයාගේ යහළුවෝ හිනීට සුබ පැතුවා. හිනී ගෙදර ගිහින් අම්මාට කිව්වා “මම තමයි පන්තියේ පළවෙනියා” කියලා. අම්මා ගොඩක් සතුටු වුණා. හැබැයි ජේනී මේ ගැන ඉරිසියයි. ජේනී කියන්නේ ගොඩක් නපුරු සිංහ පැටියෙක්.

එයා හරිම අකීකරුයි. එයාගේ අම්මත් එයාට වැරදි දේවල් තමයි කියලා දුන්නේ. හොඳ පුරුදු නෙවෙයි. එයාගේ අම්මා කියලා දුන්නේ නරක පුරුදු විතරයි. ජෙනී හිනීට හොඳ වැඩක් කරන්නම් කියලා හිතුවා. එයා මොනවා කරත් හිනීට කිසිම දෙයක් වුණේ නෑ. ජෙනී ට මේ ගැන පුදුමයි. ජෙනී හිනීගෙන් ඇහුවා

“මම ඔයාට කොච්චර කරදර කළත් ඔයාට මුකුත් වුණේ නැනේ කියලා” කිව්වා. පිනී කිව්වා “මට අම්මා කියලා දීලා තියෙන්නේ කවුරුහරි තමන්ට මොනවා කරත් ඉවසන්න කියලා. ඒ නිසා මම අම්මා කියපු දේ ඇහුවා. ඒ නිසා මට කරපු කිසිම දෙයක් මම ගණන් ගත්තේ නෑ. එහෙම තමා මම කළේ

කියලා" හිනී කිව්වා. ජෙනීට තමන් ගැනම ලැජ්ජා හිතුනා.

"අනේ මට සමාවෙන්න" හිනීට කිව්වා. හිනීත් එයාට සමාව දුන්නා. හැබැයි හිනී කිව්වා "එක කොන්දේසියක් මත ඔයා මාත් එක්ක එකතු වෙලා හොඳ වැඩ කරන්න ඕනි. ඔයාගේ නරක පුරුදු අයින් කරලා හොඳ පුරුදු ඉගෙන ගෙන ඔයාගේ අම්මාටත් හොඳ පුරුදු කියලා



දෙන්න ඕනේ'' ටික දවසක් ගියාට පස්සේ ජෙනීයි හිනීයි හොඳම යාළුවෝ වුණා. ඒ අම්මලාත් එකතු වුණා. එදා ඉඳන් ඒගොල්ලෝ සතුටින් ජීවත් වුණා.

නිමි.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්